**මන්නාරම සුළං බලශක්ති ජනන ව්‍යාපෘතිය - 2021**

මන්නාරම සුළං බලශක්ති ජනන ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළඹි අංක 3585-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV වැනි ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතේ වී (ඩී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. (අ) සුළං බලශක්ති ජනන ධාරිතාව වැඩිදියුණු කිරීම, (ආ) පද්ධති ප්‍රතික්‍රියාශීලී බලශක්ති කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ (ඇ) ව්‍යාපෘති ඉංජිනේරු සැලසුම් සමාලෝචනය සහ අධීක්ෂණය කිරීමේ ණය ගැණුම්කරුගේ ධාරිතාව සවිබලගැන්වීම මගින් ශ්‍රී ලංකාවේ පිවිතුරු බලශක්ති ජනනය වැඩි කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 39,923.06 කට සමාන වූ එජඩො මිලියන 256.70 වන අතර ඉන් රු. මිලියන 31,104.84 කට සමාන වූ එජඩො මිලියන 200 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 8,818.22 කට සමාන එජඩො මිලියන 56.70 ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2018 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර, 2020 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2022 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදි. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමකට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල<br>රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | වාහන 12 කට අදාළව 2021 දෙසැම්බර් 31 දින දක්වා කරන ලද රු. මිලියන 47.67 ක් වූ සමුච්චිත ක්ෂයවීම්, ක්ෂය සඳහා ප්‍රතිපාදන ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ලංවිම ප්‍රාග්ධන දායකත්වය ලෙස ගිණුම්ගත කර තිබුණි. | 47.67 | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් වෙනම හෙළිදරව්වක් කර ඇත. | සමුච්චිත ක්ෂයවීම් නිසි ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ සහ ලංවිමේ වාහනවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වසර 7 සිට අවුරුදු 14 දක්වා සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ වාහන සඳහා ක්ෂයවල සමස්ත බලපෑම සමාලෝචිත වර්ෂයේ ක්ෂයවීම්වලින් අඩු කිරීමෙන් වත්මන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 22.02 ක් ගලපා තිබුණි. | 22.02 | කෙරීගෙන යන වැඩ සහ ලංවිම දායකත්වයේ ශේෂය හා සසඳන විට ක්ෂයවල බලපෑම ප්‍රමාණාත්මක නොවන බව සලකන ලද බැවින්, අප පෙර කාල පරිච්ඡේද හෙළිදරව් කිරීම් සිදු කර නොමැත. | ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මෙන්ම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සඳහාද එකම ගිණුම්කරණ මූලධර්ම යොදා ගත යුතුය. |

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

### 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | අභ්‍යන්තර විගණනය චක්‍රලේඛයට අනුව සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ගනුදෙනු සඳහා පුළුල් අභ්‍යන්තර විගණනයක් 2017 දී ලංවිම අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරන ලදි. මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණකවරුන්ගෙන් ඉල්ලීමක් කර ඇත. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳ අභ්‍යන්තර විගණනය නිතිපතා සිදු කර යුතුය. |
| (ආ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය සහ 2020 ජූනි 08 දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක එස්ඊසී/2020/03 (සංශෝධිත). | අදාළ සේවකයින්ගේ වැටුප්වලින් අඩු කිරීමෙන් තොරව 2020 ඔක්තෝම්බර් දක්වා උපයන විට ගෙවන (PAYE) බද්ද සහ බදු මත බද්ද ලෙස ව්‍යාපෘතිය විසින් රු. මිලියන 15.76 ක් එහි සතු අරමුදල්වලින් ගෙවා තිබුණි. | 2020 ඔක්තෝබර් දක්වා පමණක් ලංවිම විසින් PAYE බදු දරා ඇත. මණ්ඩලය විසින් ගත් තීරණයට අනුව 2020 නොවැම්බර් මාසයේ සිට අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) සේවකයින් විසින් දරන ලදි. | PAYE බදු සේවකයින් විසින් දැරිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 මාර්තු 23 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2016 හි 4.3 වගන්තිය | චක්‍රලේඛ ප්‍රතිපාදනවලට පටහැනිව, ලබා නොගත් නිවාඩු සඳහා දීමනා සහ ප්‍රසාද දීමනා ලෙස 2021 දෙසැම්බර් 31 දක්වා එකතුව රු. මිලියන 31.87 ක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. | මෙය ලංවිම ප්‍රතිපත්තියට සහ සියලුම ලංවිම සේවකයින්ට අදාල මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදුවේ. | මණ්ඩලය චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතේ වීසී(31) වගන්තිය. | වෙනම මුදල් පොතක් පවත්වාගෙන යාම වෙනුවට ව්‍යාපෘති අංශයේ සාමාන්‍ය මුදල් පොත ව්‍යාපෘතියේ රිසිට්පත් සහ ගෙවීම් වාර්තා කිරීමට භාවිතා කර තිබුණි. | දැන් ව්‍යාපෘතිය අවසන් කර විදුලි බලාගාරය ආරම්භ කර ඇත. එබැවින්, මෙම අදියරේදී බැංකු ගිණුමක් විවෘත කිරීම කර නොහැකි ය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ගනුදෙනු මත පදනම්ව වෙනම මුදල් පොතක් ලබා ගත හැකිය. | අත්පොතෙහි අවශ්‍යතාවය අනුව වෙනම මුදල් පොතක් පවත්වාගෙන යා යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | | |
| | ප්‍රතිශතය | ප්‍රතිශතය | | |
| සුළං බලශක්ති ජනන ධාරිතාව වැඩි කිරීම | 100 | 100 | ආරම්භක නිම කිරීමේ දිනය 2020 දෙසැම්බර් වුවද, එය 2021 මාර්තු වන විට අවසන් කර තිබුණි. දිගු කාලීන අවම පිරිවැය ජනන සැලැස්මේ අරමුණ නිසි ලෙස ඉටු කර ගැනීමට නොහැකි විය. | 1985 අංක 48 සහ 1987 අංක 28 දරන ආනයන අපනයන පාලන පනත සංශෝධනය කරමින් නිකුත් කරන ලද 2020 අප්‍රේල් 16 දිනැති අංක 2171/5 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ව්‍යාපෘතියට අවශ්‍ය සමහර අයිතම තාවකාලිකව අත්හිටුවන ලදි. එම ආනයන නිෂ්කාශන කර ගැනීම සඳහා බලධාරීන්ගේ අනුමැතියට සැලකිය යුතු කාලයක් ගත වී තිබුණි. |
| පද්ධති ප්‍රතික්‍රියාශීලී බලශක්ති කළමනාකරණය වැඩිදියුණු කිරීම | 100 | 98 | ආරම්භක නිම කිරීමේ දිනය 2021 ජනවාරි වන විට වුවද, එය 2022 අප්‍රේල් වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | ජාත්‍යන්තර සංචාර සඳහා පනවා ඇති සීමාවන් සහ පරීක්ෂකගේ පැමිණීමට ඇති ප්‍රමාදයන් |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** ප්‍රමාද වීමට හේතු ලෙස දක්වා ඇති කරුණු

**විගණකගේ නිර්දේශයන්** අනවශ්‍ය වියදම් මගහරවා ගැනීම සඳහා සැලසුම් කර පරිදි කටයුතු අවසන් කර යුතුය.

**3.2 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටළු**

| අංකය | ඉඩම් කට්ටි සංඛ්‍යාව | | | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **අත්පත් කර ගැනීමට අපේක්ෂිත** | **2021 දෙසැම්බර් 31 දිනට අත්පත් කර ගැනීම්** | **හිමිකාරිත්වය මාරු කිරීම්** | | |
| (අ) | මිලදී ගත් WTG ස්ථාන (1) | 1 | 1 | සටහන් කර ගන්නා ලදි. | අනාගතයේදී ඇති විය හැකි ගැටුම් වළක්වා ගැනීම සඳහා ඉඩම්වල හිමිකාරිත්වය වහාම මාරු කර යුතුය. |
| (ආ) | WTG ස්ථාන (38) (101 උප බිම් කොටස්) | 38 (උප බිම් කොටස් 101) | උප බිම් කොටස් 47 | | |
| (ඇ) | ප්‍රවේශ මාර්ග (7) | 7 | 4 | | |
| (ඈ) | නවාතැන් භූමිය (1) | 1 (උප බිම් කොටස් 4) | උප බිම් කොටස් 2 | | |